**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ**

# වාර්ෂික වාර්තාව 2021

**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව**

**114/9, විජේරාම මාවත**

**කොළඹ 07,**

**ශ්‍රී ලංකාව**

## අන්තර්ගතය


දැක්ම ........................................ 3

මෙහෙවර ........................................ 3

ඉලක්ක ........................................ 3

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති  සභාවේ අරමුණු ........................................ 4

සභා පාලක මණ්ඩලයේ සාමාජිකවරු - 2021 ........................................ 5

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය ........................................ 9

සභාපතිවරයා ගේ වාර්තාව ........................................ 11

ලේකම්වරයාගේ  වාර්තාව ........................................ 13

2021 වසර තුළ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ක්‍රියාකාරකම් ........................................ 15

කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරණය ........................................ 22

විද්‍යාඥවරුන් අභිප්‍රේරණය කිරීම ........................................ 26

අරමුදල් සැපයීම ........................................ 27

මානව සම්පත් සංවර්ධනය ........................................ 29

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ප්‍රකාශන - 2020 ........................................ 32

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම   - 2021 ........................................ 33

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ කාර්ය මණ්ඩලය ........................................ 30

කෘතඥතාව ........................................ 32

## දැක්ම

| |
|---|
| ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය සහතික කෙරෙන සුපැහැදිළි හා තිරසාර කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන පද්ධතියක් |

## මෙහෙවර

| |
|---|
| ප්‍රතිපත්ති සැකසීම, සුසාධ්‍යකරණය, සම්බන්ධීකරණය, අධීක්ෂණය හා අගැයීම සහ බලපෑම් තක්සෙරුව හරහා ජාතික සංවර්ධන ඉලක්ක වෙත කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නවෝත්පාදන යොමු කිරීම පිළිබඳ ව සහතික වීම |

## ඉලක්ක

| | |
|---|---|
| 1 වන ඉලක්කය: | කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නවෝත්පාදනය ජාතික සංවර්ධන ඉලක්ක වෙත දිශානති කිරීම |
| 2 වන ඉලක්කය: | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ ධාරිතා බල සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම |
| 3 වන ඉලක්කය: | ලෝක සම්මානනීය පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන තත්ත්වය සාක්ෂාත් කර ගැනීම |
| 4 වන ඉලක්කය: | රේඛීය නියෝජිතායතන තුළ අඛණ්ඩ කාර්යසාධන අගැයීම ප්‍රවර්ධනය කිරීම |
| 5 වන ඉලක්කය: | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන ව්‍යාප්තිකරණය හා දැනුවත්භාවය බිහි කිරීම ප්‍රවර්ධනය කිරීම |
| 6 වන ඉලක්කය: | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියට සේවා සැපයීම් වස් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනයික ධාරිතා බලය ශක්තිසම්පන්න කිරීම |

## ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අරමුණු

1. කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නවෝත්පාදනයන්හි විශිෂ්ටත්වය ළඟා කර ගැනීම
2. ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම සඳහා කෘෂිකාර්මික පර්යේෂණ හා නවෝත්පාදන දිශානති කිරීම
3. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ හා නවෝත්පාදන පද්ධතියේ (විද්‍යාත්මක හා තාක්ෂණික) ධාරිතාව වැඩි දියුණු කිරීම.
4. කෘෂිකාර්මික සංවර්ධනයට ආධාර කිරීම අරභයා ඉහළ ප්‍රමිතියෙන් යුතු, ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
5. ලෝක මට්ටමේ පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන සාක්ෂාත් කර ගැනීම සඳහා කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම
6. ජාතික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන වැඩසටහන්වල සහ ආයතනවල ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම
7. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන වැඩසටහන් ව්‍යාප්ත කිරීම හා දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම
8. ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම

## සභා පාලක මණ්ඩලයේ සාමාජිකවරු - 2021

1. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සභාපති මහාචාර්ය ගාමිණී සේනානායක මැතිතුමා

2. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා මැතිතුමා, 2021.08.17 දක්වා

3. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) ආචාර්ය ඩබ්ලිව්. එල්. ජී. සමරසිංහ මැතිතුමා, 2021.10.11 සිට

4. මුදල් අමාත්‍යාංශයේ, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පී. ජී. එස්. එච්. කුමාර මැතිතුමා, 2021.07.20 දක්වා

5. මුදල් අමාත්‍යාංශයේ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එච්. ජී. වී. කේ. ටී. ගුණවර්ධන මැතිනිය, 2021.09.24 සිට

6. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. වීරකෝන් මැතිතුමා, 2021.09.21 දක්වා

7. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා මැතිතුමා, 2021.09.16 සිට

8. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, අතිරේක සංරක්ෂණ ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන), ආචාර්ය කේ. එම්. ඒ. බණ්ඩාර මැතිතුමා, 2021.06.15 දක්වා

9. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, අතිරේක සංරක්ෂණ ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන), දීපානි අලවතුගොඩ මැතිනිය, 2021.10.25 සිට

10. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි මැතිතුමා

11. ගන්නෝරුව, පශු පර්යේෂණ ආයතනයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පශු පර්යේෂණ), පශු වෛද්‍ය ජී. ඒ. ගුණවර්ධන මහත්මිය

12. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආර්ථික විද්‍යාඥ විත්‍රාල් ජයවර්ධන මැතිතුමා

13. තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය එල්. එස්. කේ. හෙට්ටිආරච්චි මැතිතුමා

14. වැවිලි අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජේ. එම්. ටී. ජයසුන්දර මහත්මිය

15. ජාතික විද්‍යා පදනමෙහි සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න මැතිතුමා

16. ඇග්‍රෝ කල්චර් ට්‍රෙන්ඩ්ස් පෞද්ගලික සමාගමෙහි සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ අනුර වීරකෝන් මැතිතුමා

17. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ලේකම්/ අධ්‍යක්ෂ ප්‍රභාත් විමල් කුමාර මැතිතුමා

**සභා පාලක මණ්ඩලයේ රැස්වීම් සඳහා සාමාජිකවරුන් පැමිණීම**

| අංක | නම | 234 වන රැස්වීම 19.01.2021 | 235 වන රැස්වීම 16.02.2021 | 236 වන රැස්වීම 16.03.2021 | 237 වන රැස්වීම 20.04.2021 | 238 වන රැස්වීම 18.05.2021 | 239 වන රැස්වීම 15.06.2021 | 240 වන රැස්වීම 20.07.2021 | 241 වන රැස්වීම 17.08.2021 | 242 වන රැස්වීම 21.09.2021 | 243 වන රැස්වීම 26.10.2021 | 244 වන රැස්වීම 16.11.2021 | 245 වන රැස්වීම 21.12.2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මහාචාර්ය ගාමිණී සේනානායක | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය |
| 2 | ප්‍රභාත් විමල් කුමාර මැතිතුමා | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය |
| 3 | ආචාර්ය කේ. එම්. ඒ. බණ්ඩාර | පැමිණියේ නැත | පැමිණියේ නැත | පැමිණියේ නැත | පැමිණියේ නැත | කරුණු දැක්වීය | කරුණු දැක්වීය | x | x | x | x | x | x |
| 4 | පශු වෛද්‍ය ජී. ඒ. ගුණවර්ධන | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය |
| 5 | ආචාර්ය ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. වීරකෝන් | පැමිණියේ නැත | පැමිණියේ ය | පැමිණියේ නැත | පැමිණියේ නැත | කරුණු දැක්වීය | පැමිණියේ ය | පැමිණියේ නැත | කරුණු දැක්වීය | x | x | x | x |
| 6 | ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය |
| 7 | පී. ජී. එස්. එච්. කුමාර මහතා | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | කරුණු දැක්වීය | x | x | x | x | x | x |
| 8 | ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය |
| 9 | චිත්‍රාල් ජයවර්ධන මහතා | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | කරුණු දැක්වීය | පැමිණියේ ය | පැමිණියේ ය |
| 10 | ආචාර්ය එල්. එස්. කේ. | පැමිණියේ | පැමිණියේ | පැමිණියේ ය | පැමිණියේ ය | කරුණු දැක්වීය | පැමිණියේ | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | කරුණු දැක්වීය | පැමිණියේ ය |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | හෙට්ටිආරච්චි | නැත | නැත | | | | නැත | | | | | | |
| 11 | ජේ. එම්. ටී. ජයසුන්දර මහත්මිය | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය | කරුණු දැක්වීය | පැමිණියා ය | පැමිණියේ නැත | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය |
| 12 | මහාචාර්ය රංජිත් සේනාරත්න | පැමිණියේ ය | පැමිණියේ නැත | පැමිණියේ ය | පැමිණියේ නැත | කරුණු දැක්වීය | කරුණු දැක්වීය | පැමිණියේ නැත | පැමිණියේ ය | කරුණු දැක්වීය | පැමිණියේ ය | කරුණු දැක්වීය | පැමිණියේ නැත |
| 13 | අනුර වීරකෝන් මැතිතුමා | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය | කරුණු දැක්වීය | කරුණු දැක්වීය | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය |
| 14 | එච්. ජී. වී. කේ. ටී. ගුණවර්ධන මැතිනිය | x | x | x | x | x | x | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය | පැමිණියා ය |
| 15 | ආචාර්ය ඩබ්ලිව්. එල්. ජී. සමරසිංහ | x | x | x | x | x | x | x | x | x | පැමිණියේ ය | පැමිණියේ ය | පැමිණියේ ය |
| 16 | දීපානි අලවතුගොඩ මැතිනිය | x | x | x | x | x | x | x | x | x | x | පැමිණියා ය | පැමිණියේ නැත |

| x | පත් නො වීය |
|---|---|

**සභා පාලක මණ්ඩලයේ රැස්වීම් - 2021**

2021 වර්ෂය තුළ පාලක සභා රැස්වීම් දොළහක් පවත්වන ලදී. 2021 වසරෙහි දී සභා පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස මහාචාර්ය ගාමිණී සේනානායක මැතිතුමා කටයුතු කළේ ය. 2021 වසරෙහි දී පාලක මණ්ඩලයේ ලේකම්/ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේ ප්‍රභාත් විමල්කුමාර මැතිතුමා ය.

**විගණන හා කළමනාකරණ කමිටුව - 2021**

2021 වර්ෂය තුළ ප්‍රතිපත්ති සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව (AMC) විසින් මූල්‍ය හා පරිපාලනමය කරුණු සම්බන්ධ ව සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් දෙකක් පවත්වන ලදී.

| නම | ආයතනය | 62 වන රැස්වීම 16.02.2021 | 63 වන රැස්වීම 20.07.2021 | 64 වන රැස්වීම 09.12.2021 |
|---|---|---|---|---|
| පී. ජී. එස්. එච්. කුමාර (සභාපති) | නියෝජ්‍ය අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | පැමිණියේය | x | x |
| එච්. ජී. වී. කේ. ටී. ගුණවර්ධන මැතිනිය (සභාපති) | සහකාර අධ්‍යක්ෂ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය | x | පැමිණියාය | පැමිණියාය |
| ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා | අතිරේක ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | පැමිණියේය | පැමිණියේය | පැමිණියේය |
| ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය | පැමිණියේය | පැමිණියේය | පැමිණියේය |
| ඩබ්ලිව්. එස්. බෝපගමගේ මහත්මිය | විගණන අධිකාරී, කෘෂිකර්ම, ගොවිජන රක්ෂණ මණ්ඩලය | පැමිණියාය | පැමිණියාය | පැමිණියාය |
| යූ. එස්. එල්.කුමාර මහතා | අභ්‍යන්තර විගණක, කෘෂිකර්ම අමාත්‍යාංශය | පැමිණියේය | x | පැමිණියේය |
| ඊ. ඩබ්ලිව්. පී. කේ. ප්‍රියදර්ශන මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක, කෘෂිකර්ම අමාත්‍යාංශය | x | පැමිණියේය | පැමිණියේය |

## හැඳින්වීම

1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත බලාත්මක කිරීමත් සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ 1987 දෙසැම්බර් 22 වන දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP) පිහිටුවන ලදී. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය (NARS) තුළ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ක්‍රියාකාරී සහයෝගීත්වය ලබා දීම සභාව මගින් ඉටු විය. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මගින් කෘෂිකාර්මික අංශයේ පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය වේ. ප්‍රතිපත්ති සභාවේ ප්‍රධාන කාර්යයන් වනුයේ පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනීම, අදාළ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම තුළින් අන්තර්-ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, පර්යේෂණයන්හි ඇති බාධක නිරාකරණය කිරීම සහ අදාළ කමිටුවල ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා කාර්යභාරයක් ඉටු කිරීමයි. සභා පාලක මණ්ඩලය විසින් පිහිටුවන ලද ජාතික ආංශයික කමිටු හයක් වර්තමානයේ දී ක්‍රියාත්මක වෙයි:

ආහාර භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFCS)
වැවිලි භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව (NCPCS)
මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFLS)
වන වගා අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFS)
ධීවර හා ජලජ සම්පත් අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFARS)
පශු සම්පත් හා කුකුළු පාලන අංශය පිළිබඳ ජාතික කමිටුව (NCLPS)

මෙයට අමතර ව, විශේෂිත විද්‍යාත්මක සේවාවන් සඳහා විශේෂ විද්‍යාත්මක කමිටු පත් කරන ලදී;

i. ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සහරාව පිළිබඳ සංස්කාරක මණ්ඩලය
ii. පර්යේෂණ දීමනාව පිළිබඳ අනු කමිටු

## ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය

1. කෘෂිකාර්මික පර්යේෂණ සංවිධානය කිරීම, සම්බන්ධීකරණය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන වෙනත් අදාළ කරුණු පිළිබඳ ව රජයට උපදෙස් දීම;

2. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය හා ප්‍රමුඛතා සකස් කිරීම;

3. ජාතික සංවර්ධන අරමුණු තවදුරටත් ඉදිරියට ගෙන යාමේ අරමුණින් කෘෂිකාර්මික පර්යේෂණවල සමස්ත අරමුණු හා විෂය පථය නිර්වචනය කිරීම;

4. කෘෂිකාර්මික පර්යේෂණ ආයතන හා සංස්ථාපනවලට අවශ්‍ය මූල්‍ය, මිනිස්බල හා භෞතික සම්පත් සහ එම ආයතනවල සහ සංස්ථාපනවල කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි පිළිබඳ සුදුසු බලධාරීත්වයනට නිර්දේශ ඉදිරිපත් කිරීම;

5. ආයතනික හා දෙපාර්තමේන්තු කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් සමාලෝචනය කිරීම සහ ඒවායේ ප්‍රමුඛතා සහ අරමුදල් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන විෂයය භාර අමාත්‍යවරයා ගේ අමාත්‍යංශයට නිර්දේශ ඉදිරිපත් කිරීම;

6. කෘෂිකාර්මික පර්යේෂණවල විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැපයීම;

7. කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සහ රජය අතර සන්නිවේදන මාර්ගයක් ලෙස ක්‍රියා කිරීම;

8. අන්තර්-ආයතනික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කිරීම;

9. සමස්ත කෘෂිකාර්මික පර්යේෂණ අංශය සඳහා විශේෂ විද්‍යාත්මක සේවාවන් සංවිධානය කිරීම හා අරමුදල් සැපයීම;

10. ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම;

11. කෘෂිකාර්මික පර්යේෂණවලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර්-ආයතනික කරුණු පිළිබඳ සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම;

12. කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සලස්වා දීම හා විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමඟ විද්‍යාඥවරුන් හුවමාරු කර ගැනීම; සහ

13. කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන හා අංශවල කාර්යසාධනය කලින් කලට සමාලෝචනය කිරීම.

## සභාපතිවරයා ගේ වාර්තාව

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි අග්‍රගත සංවිධානය වන අතර රටෙහි සමාජ-ආර්ථික අභිවර්ධනය උදෙසා වන නව තාක්ෂණවේද සංවර්ධනය හා නවෝත්පාදනය අරභයා පර්යේෂණ සිදු කිරීම වෙනුවෙන් අරමුදල් සැපයීම එහි පැවරුම් කාර්යභාරයක් වේ. පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා දීම හා අධීක්ෂණය කිරීම, කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සමාලෝචනය කිරීම සහ මානව සම්පත් ධාරිතා ගොඩනැංවීම වැනි කර්තව්‍යයන් රාශියක් හරහා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව රටෙහි සංවර්ධනය වෙනුවෙන් අතිමහත් දායකත්වයක් ලබා දී තිබේ.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි පර්යේෂණ ආයතනවල පර්යේෂණ ප්‍රතිදානය නිර්ණය කිරීම් වස් එම ආයතන බාහිර සමාලෝචනයට භාජනය කිරීම ද කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි පැවරුම් කාර්යභාරයකි. මෙම බාහිර අගැයීම්වල ප්‍රධාන අරමුණු වනුයේ කාර්ය සාධනය අගැයීම, ප්‍රශස්ත ක්‍රියා පටිපාටි හඳුනා ගැනීම, අඛණ්ඩ සංවර්ධනය දිරිගැන්වීම හා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය ඇතුළත පර්යේෂණ සංස්කෘතියක් සංස්ථාපනය කිරීම යි. සභා පාලක මණ්ඩලය විසින් පත්කරන ලද විද්වත් කමිටුවක් විසින්, 2021 හිදී, ආයතන පිළිබඳ බාහිර සමාලෝචනය සිදු කිරීම සඳහා වන ආකෘතිමය මාර්ගෝපදේශ සංවර්ධනය කරනු ලැබිණ. මෙම විද්වත් කමිටුව, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි පර්යේෂණ ආයතන අගැයීම පිණිස වන නව ලකුණු පද්ධතියක් හඳුන්වා දුන්හ.

කොවිඩ් 19 රෝග ව්‍යාප්ති තත්ත්වය 2021 හිදී ද ආයතනයෙහි නියමිත ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි ලෙස බලපෑවේ ය. එමෙන් ම එය රටෙහි ආර්ථිකය හා සමාජය කෙරෙහි මෙන් ම, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි පර්යේෂණ ක්‍රියාකාරිත්වය කෙරෙහි ද සෘණාත්මක බලපෑම් ඇති කළේ ය. කෙසේ වුව ද, එම අස්ථාවරත්වයන් යටතෙහි දී ද ප්‍රතිපත්ති සභාව සිය වැඩකටයුතු අඛණ්ඩ ව සිදු කළ අතර ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි විද්‍යාඥවරුන් සඳහා බොහෝ සේවාවන් ලබා දුන්නේ ය. කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය ප්‍රතිපත්ති සභාවෙහි ධාරිතා බල ගොඩනැංවීමේ වැඩසටහන වෙත ද අයහපත් බලපෑම් එල්ල කළේ ය. ලබා දෙන ලද කාල සීමාව ඇතුළත සිය අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට බොහෝ ශිෂ්‍යත්වලාභීන් හට නො හැකි විය. සිය උපාධි අධ්‍යයන සාර්ථක ව සම්පූර්ණ කර ගැනීම පිණිස, පශ්චාත් උපාධි සඳහා විදේශ විශ්ව විද්‍යාලයන්හි අධ්‍යයන කටයුතු සිදු කරන ශිෂ්‍යත්වලාභීන් වෙනුවෙන් අධ්‍යයන කාල සීමාව දීර්ඝ කරන ලදී. කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතු කොට ගෙන පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කළ නො හැකි වූ ශිෂ්‍යත්වලාභීන් සය දෙනකු ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම පිණිස විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ද ලබා ගන්නා ලදී. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි විද්‍යාඥවරුන් ගේ මානව සම්පත් ධාරිතා බල සංවර්ධනය කිරීම උදෙසා වූ දේශීය පශ්චාත් උපාධි වැඩසටහන ආරම්භ කරන ලද්දේ රටෙහි පවතින අර්බුදකාරී තත්ත්වය සැලකිල්ලට ගනිමිනි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ පශු පර්යේෂණ ආයතනය වෙතින් මේ සඳහා පර්යේෂකවරුන් සත් දෙනකු තෝරා ගනු ලැබිණ.

2022 වසර සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් සැපයීම පිණිස පර්යේෂණ ව්‍යාපෘති කැඳවීම උදෙසා සලකා බැලීම පෙරදැරි කර ගෙන, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය හා ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය වෙතින් මෙම වසරෙහි දී පර්යේෂණ සංකල්ප පත්‍රිකා 105 ක් ලබා ගන්නා ලදී. ප්‍රතිපත්ති සභාවෙහි පර්යේෂණ කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් මෙම පත්‍රිකා අගයන ලදු ව හා ඉන් පසු වඩා සුදුසු පත්‍රිකා තෝරා ගන්නා ලදු ව, ඒවාට අදාළ අයැදුම්කරුවන් වෙතින් පර්යේෂණ

ව්‍යාපෘති කැඳවනු ලැබිණ. තෝරා ගන්නා ලද සංකල්ප පත්‍රිකා, කාබනික පොහොර හා සම්බන්ධ 33 ක්, කාබනික පළිබෝධ නාශක හා සම්බන්ධ 19 ක් හා වෙනත් 55 ක් ලෙස කාණ්ඩගත කෙරිණ.

කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පිළිබඳ බාහිර සමාලෝචනයෙහි දී, බාහිර සමාලෝචන කමිටුව විසින් කරන ලද නිර්දේශය අනුව, විෂයානුබද්ධ ජාතික කමිටු වෙනුවට ජාතික ආංශයික කමිටු හයක් පත්කරනු ලැබිණ. පත්කරන ලද නව කමිටු වූයේ, ආහාර භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව, වැවිලි භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව, මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුව, වන වගා අංශය පිළිබඳ ජාතික කමිටුව, ධීවර හා ජලජ සම්පත් අංශය පිළිබඳ ජාතික කමිටුව හා පශු සම්පත් හා කුකුළු පාලන අංශය පිළිබඳ ජාතික කමිටුව යි. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය, ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය හා පෞද්ගලික අංශය නියෝජනය කෙරෙන, අදාළ අංශය පිළිබඳ කුසලතාව/ පළපුරුද්ද සහිත සාමාජිකවරුන් මෙම  ජාතික ආංශයික කමිටුවලට පත් කෙරිණ. එක් එක් ආංශයික කමිටුවේ සභාපති ලෙස පත්කරනු ලැබූයේ සභා පාලක මණ්ඩලයේ ඒ ඒ අංශය නියෝජනය කරන සභා පාලක මණ්ඩල සාමාජිකයා යි. සියලු ම ආංශයික කමිටුවල සභාපතිවරුන්/ සභාපතිවරියන් එක් වූ රැස්වීමක් පවත්වන ලදී. මෙම රැස්වීමෙහි දී, ජාතික ආංශයික කමිටුවල යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර අවසන් කරනු ලැබිණ. රෝග ව්‍යාප්ති තත්ත්වය හේතු කොට ගෙන, සියලු ම රැස්වීම් හා වැඩමුළු පවත්වන ලද්දේ අන්තර්ජාලය හරහා ය.

මෙම තීරණාත්මක කාල සීමාව තුළ ආයතනය නිසි ලෙස  කළමනාකරණය කිරීම පිණිස ලබා දුන් සහයෝගය වෙනුවෙන් මම  සියලු ම සභා පාලක මණ්ඩල සාමාජිකවරුන් හට මා ගේ කෘතඥතාව පළකරමි. සිය සේවාවන් ඉටු කිරීමෙහි ලා ආයතන අධ්‍යක්ෂ,  පර්යේෂණ කළමනාකරණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති සහා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥවරුන්,  පර්යේෂණ නිලධරයන්, පරිපාලන සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරි සහ සියලු ම කාර්ය මණ්ඩල සාමාජිකවරුන් ගේ කැපවීම හා  කාර්ය සාධනය අගය කරමින් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

මහාචාර්ය ගාමිණි සේනානායක
සභාපති
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

## ලේකම්වරයාගේ වාර්තාව

1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතට අනුව, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි පැවරුම් කාර්ය භාරයන් වනුයේ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය (NARS) තුළ පර්යේෂණ සම්බන්ධීකරණය, මානව සම්පත් සංවර්ධනය, කෘෂිකාර්මික පර්යේෂණ විශිෂ්ඨත්වය ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැපයීම යි. ආරම්භයෙහි සිට, ප්‍රතිපත්ති සභාව, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියට ආධාර කිරීමෙහි සක්‍රිය ව නිරත ව සිටිමින්, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල විද්‍යාඥවරුන් හට පර්යේෂණ ප්‍රදාන මෙන් ම මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ලබා දීම ද සිදු කරයි. ප්‍රතිපත්ති සභාවේ ප්‍රධානතම කාර්ය පැවරුම වනුයේ, රටෙහි කෘෂිකාර්මික අංශය නඟාසිටුවීම අරභයා පර්යේෂණ ප්‍රතිපත්ති සහ පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම යි. 2021 වසර තුළ, ජාතික ආංශයික කමිටු හයක් පත්කරන ලදු ව, අතථ්‍ය රැස්වීම් හරහා ක්‍රියාත්මක වූහ. ජාතික ආංශයික කමිටුවල යොමු කිරීමේ අනුදේශ හා පර්යේෂණ ප්‍රමුඛතා සාකච්ඡාවට බඳුන් කර අවසන් කරනු ලැබිණ. මෙම කමිටු ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි නව පර්යේෂණ සංකල්ප පත්‍රිකා 105 ක් අගැයීමට බඳුන් කර, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුමෙහි 2022 වර්ෂයෙහි වැඩසටහන සඳහා පර්යේෂණ යෝජනාවලි කැඳවූහ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි සියලු ම ආයතනවල 2021 වසරෙහි ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කරන ලද අතර එහි දී අනාවරණය වූයේ එම සියලු ම ආයතන ප්‍රතිපත්ති සභාව විසින් ස්ථාපනය කරන ලද පර්යේෂණ ප්‍රමුඛතාවනට අනුකූල වන බව ය.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි ආයතනවල මානව සම්පත් සංවර්ධනය කිරීම අරභයා අමාත්‍ය මණ්ඩලය අනුමත කළ ධාරිතා බල සංවර්ධන වැඩසටහන අනුව, 2021 වසරෙහි දී තෝරා ගැනීම් තවදුරටත් සිදුකරන ලදු ව, පශ්චාත් උපාධි අධ්‍යයනයන් සඳහා අපේක්ෂකයෝ තිදෙනෙක් මැලේසියාවේ පුත්‍ර විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලදහ. දේශීය පශ්චාත් උපාධි වැඩසටහන යටතෙහි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ පශු පර්යේෂණ ආයතනය වෙතින් පර්යේෂකවරුන් සත් දෙනකු තෝරා ගනු ලැබිණ.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතන 13 ක් එනම්, පොල් පර්යේෂණ ආයතනය (CRI), තල් පර්යේෂණ ආයතනය (PRI), රබර් පර්යේෂණ ආයතනය (RRI), උක් පර්යේෂණ ආයතනය (SRI), තේ පර්යේෂණ ආයතනය (TRI), පශු පර්යේෂණ ආයතනය (VRI), ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA), පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය (IPHT), හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI) , ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව (DNBG), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DFC), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DEA) සහ උප ආයතන 19 ක් ඇතුළු ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA) වෙතින් ප්‍රතිපත්ති සභාව වාර්ෂික ව, විද්‍යුත් ආකෘතියක් තුළ, පර්යේෂණ නිලධරයන්, පර්යේෂණ ව්‍යාපෘති සහ පුනරාවර්තන පර්යේෂණ අයවැය පිළිබඳ ගෙවුණු වර්ෂයට සම්බන්ධ තොරතුරු එක්රැස් කරයි. 2021 වසරෙහි දී දත්ත පදනම් තිස් එකක් එකතු කිරීමට අපේක්ෂා කළ අතර තිහක් එකතු කරන ලදී. එක්රැස් කරන ලද දත්ත පදනම් සකස් කර, පිරිපහදු කර යළි අදාළ ආයතනයවලට ඉදිරිපත් කෙරිණ. සකස් කරන ලද මෙම දත්ත පදනම් ඉන්ෆෝර්ම් - 2020 ජාතික දත්ත පදනම ලෙස සම්පාදනය කෙරිණ. නව ඉන්ෆෝර්ම් සම්බන්ධිකාරකවරුන් පස් දෙනකු සඳහා අන්තර්ජාලය හරහා පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි පර්යේෂණ ආයතනවල පර්යේෂණ ප්‍රතිදානය අගැයීම පිණිස එම ආයතන බාහිර සමාලෝචනයට භාජනය කිරීම ද කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි පැවරුම් කාර්යභාරයකි. සභා පාලක මණ්ඩලය විසින් පත්කරන ලද විද්වත් කමිටුවක් විසින්, 2021 හිදී, ආයතන පිළිබඳ බාහිර සමාලෝචනය සිදු කිරීම සඳහා වන නව ශ්‍රේණිගත කිරීම් ක්‍රමවේදයක් සහ මාර්ගෝපදේශ සකස්කරනු ලැබිණ. 2021 වසරෙහි දී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය සහ සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය බාහිර සමාලෝචනයට භාජනය කිරීස පිණිස සභා පාලක මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

අවසාන වශයෙන්, 2021 වසරෙහි බලපැවැත්වූ කොවිඩ් 19 රෝග ව්‍යාප්ති තත්ත්වය තුළ වුව ද ප්‍රතිපත්ති සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා සභාවේ සභාපති, සභා පාලක මණ්ඩල සාමාජිකවරුන්, විගණන හා කළමණාකරණ කමිටු සාමාජිකවරුන්, සියලු ම ජාතික කමිටු සාමාජිකවරුන් සහ ප්‍රතිපත්ති සභාවෙහි කාර්ය මණ්ඩලය වෙහෙස නො බලා ලබා දුන් සහයෝගය වෙනුවෙන් මා ගේ අවංක කෘතඥතාව පළ කරමි.

ප්‍රභාත් විමල් කුමාර
ලේකම්/ අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

## 2021 වසර තුළ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ක්‍රියාකාරකම්

### කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සකස් කිරීම

**ආවරණය කර ඇති පැවරුම් කාර්යය**

- කෘෂිකාර්මික පර්යේෂණ සංවිධානය කිරීම, සම්බන්ධීකරණය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන වෙනත් අදාළ කරුණු පිළිබඳ ව රජයට උපදෙස් දීම (1)

- ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය හා ප්‍රමුඛතා සකස් කිරීම (2)

- ජාතික සංවර්ධන අරමුණු තවදුරටත් ඉදිරියට ගෙන යාමේ අරමුණින් කෘෂිකාර්මික පර්යේෂණවල සමස්ත අරමුණු හා විෂය පථය නිර්වචනය කිරීම (3)

- කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සහ රජය අතර සන්නිවේදන මාර්ගයක් ලෙස ක්‍රියා කිරීම (7)

- කෘෂිකාර්මික පර්යේෂණවලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර්-ආයතනික කරුණු පිළිබඳ සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම (11)

**2021 හි දී ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතන 25 ක පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම**

ප්‍රතිපත්ති සභාවේ වඩාත්ම වැදගත් පැවරුම් කාර්යයක් වන්නේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම යි. වැවිලි, ආහාර භෝග, ධීවර, පශු සම්පත්, වන විද්‍යා හා මල් වගාව යන අංශ ආවරණය වන පරිදි ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතන 25 හි පර්යේෂණ කටයුතු සඳහා රජයේ අරමුදල් සැලකිය යුතු ප්‍රමාණයක් වාර්ෂික ව වෙන් කරනු ලැබේ. එබැවින්, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රමුඛතා අනුව එම අරමුදල් භාවිතයෙහි යෙදවෙන්නේ ද යන්න සොයා බැලීම ඉතා වැදගත් වේ. 2021 වසරෙහි ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කරන ලද්දේ එම ක්‍රියාකාරී සැලසුම් ප්‍රතිපත්ති සභාව විසින් ස්ථාපනය කරන ලද පර්යේෂණ ප්‍රමුඛතාවනට අනුකූල වන බව පරීක්ෂා කිරීමට ය. මෙම විශ්ලේෂණය පදනම් කර ගනිමින් කෘෂිකාර්මික පර්යේෂණ තත්ත්ව වාර්තාව වාර්ෂික ව පිළියෙළ කර විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රකාශනයට පත්කරනු ලැබේ. තත්ත්ව වාර්තාව මුද්‍රණය කරනු ලබන්නේ සිව් වාර්ෂික ව ය. පර්යේෂණ ආයතන 25 ක් වෙතින් ක්‍රියාකාරී සැලසුම් ලබා ගන්නා ලදී.

**ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම (NARP) - 2021 වර්ෂය**

ශ්‍රී ලංකාවේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම (NARP) යනු ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි (NARS) කෘෂිකාර්මික පර්යේෂණ සහ ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙහි කෘෂිකාර්මික/ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සැපයීමේ වැඩසටහන යි. මෙම ව්‍යාපෘති සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් නිශ්චිත කාල සීමාවක් සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්ට අනුකූල ව ය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්මාන්තය සම්බන්ධ පර්යේෂණ සිදුකරන ජාතික විශ්ව විද්‍යාල සඳහා දැනට අරමුදල් සපයනු ලැබේ. වසර 1 සිට 3 දක්වා වන කාල සීමා සඳහා වාර්ෂික ව ව්‍යාපෘති ප්‍රදානය කරනු ලැබේ. 1. එළඹෙන වර්ෂය සඳහා පර්යේෂණ සංකල්ප පත්‍රිකා කැඳවීම, අගැයීම හා තෝරා ගැනීම 2. තෝරා ගන්නා ලද සංකල්ප පත්‍රිකා සම්බන්ධ පර්යේෂණ යෝජනාවලි කැඳවීම, අගැයීම හා භාණ්ඩාගාරය වෙතින් අරමුදල් ලබා දීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම 3. ක්‍රියාකාරි පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම 4. ව්‍යාපෘතිවල සමාප්ති වාර්තා අගැයීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

පළමුවෙන් ම අදාළ සංකල්ප පත්‍රිකා කැඳවීම සිදු කරන ලදී. ඉන් පසු, පර්යේෂණ යෝජනාවලි කැඳවීම සඳහා වඩාත් සුදුසු සංකල්ප පත්‍රිකා තෝරා ගැනීම පිණිස එම පත්‍රිකා තෝරා ගැනීම් නිර්ණායක අනුව අගැයීමට පාත්‍ර කර තෝරා ගැනීම් ලකුණු අනුව ශ්‍රේණිගත කරනු ලැබිණ. තෝරා ගන්නා ලද සංකල්ප පත්‍රිකා හා සම්බන්ධ පර්යේෂණ යෝජනාවලි කැඳවීම සිදු කරන ලදී. මෙයින් අනතුරු ව, අදාළ විෂයයෙහි ප්‍රවීනයන් වන බාහිර සමාලෝචකවරුන් දෙදෙනකු විසින් ප්‍රතිපත්ති සභාව විසින් සකස් කරන ලද අගැයීම් නිර්ණායක අනුව පර්යේෂණ යෝජනාවලි අගැයීම/ සමාලෝචනය කිරීම සිදු කර අදාළ ආංශයික කමිටුව වෙත අවසන් නිර්දේශ කිරීම සඳහා ද සභා පාලක මණ්ඩලය වෙත අනුමත කිරීම පිණිස ද යොමු කරනු ලැබිණ. සභා පාලක මණ්ඩලයෙහි අනුමැතිය ලබා ගැනීමෙන් පසු ව එම පර්යේෂණ යෝජනාවලි කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලදී.

2021 වසරෙහි දී මෙම වැඩසටහන යටතෙහි නව ව්‍යාපෘති 31 ක් ප්‍රදානය කරනු ලැබිණ (කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට 22 ක් සහ ජාතික විශ්ව විද්‍යාලවලට 09 ක් ලෙස). ක්‍රියාත්මක වූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 65 ක් (කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 47 ක්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 04 ක් සහ ජාතික විශ්ව විද්‍යාලවල 14 ක්) විය. පළමුවැනි අර්ධය සඳහා අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගන්නා ලදු ව, අර්ධ වාර්ෂික ප්‍රගති අධීක්ෂණය අදාළ කමිටු/ අනුකමිටු විසින් විශාලන තාක්ෂණය ඔස්සේ සිදු කරන ලදී. ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය වෙතින් පළමුවැනි අර්ධය සඳහා අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා ලබා නො ගන්නා ලද්දේ අරමුදල් වූයේ 2021 ජුනි දක්වා පමණක් බැවිනි. 2021 වර්ෂය සඳහා වූ පළමුවැනි අරමුදල් කොටස ඔවුන් හට සපයන ලද්දේ 2021 ජුනි මස දී ය. සමාප්ති වාර්තා 11 ක් ලබා ගන්නා ලද අතර 9 ක් අගැයීම පිණිස බාහිර සමාලෝචකවරුන් වෙත යවනු ලැබිණ.

2022 වසර සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් සැපයීම පිණිස පර්යේෂණ ව්‍යාපෘති කැඳවීම උදෙසා සලකා බැලීම පෙරදැරි කර ගෙන, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය හා ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය වෙතින් මෙම වසරෙහි දී පර්යේෂණ සංකල්ප පත්‍රිකා 105 ක් ලබා ගන්නා ලදී. ප්‍රතිපත්ති සභාවෙහි පර්යේෂණ කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් මෙම පත්‍රිකා අගයන ලදු ව හා ඉන් පසු වඩා සුදුසු පත්‍රිකා 79 ක් තෝරා ගන්නා ලදු ව (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - 19 හා ජාතික

විශ්ව විද්‍යාල පද්ධතිය - 43), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙතින් පර්යේෂණ ව්‍යාපෘති යෝජනාවලි කැඳවනු ලැබිණ. ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය වෙත 2022 වර්ෂය සඳහා අරමුදල් ලබා දී නො තිබුණු බැවින් එම වසර සඳහා විශ්ව විද්‍යාල පද්ධතිය වෙතින් ව්‍යාපෘති යෝජනාවලි කැඳවනු නො ලැබිණ.

**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ජාතික ආංශයික කමිටු**

**ආහාර භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFCS)**

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 16 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි ආහාර භෝග අංශය නියෝජනය කරන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි පර්යේෂණ කළමනාකරණ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය පී. සී ගිරිහාගම මහත්මිය කමිටුවෙහි ලේකම් වූවා ය. 2021 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව දැනුවත් වනු ලැබිණ. ආහාර භෝග අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී. පර්යේෂණ හිඩැස්/ ලුහුඬුතා සහ අවශ්‍යතා හඳුනා ගැනීම උදෙසා සේවා ප්‍රතිග්‍රාහක වැඩමුළුවක් පැවැත්වීමට ද සියලු ම සේවා ප්‍රතිග්‍රාහකයනට ආරාධනා කිරීමට ද තීරණය කෙරිණ. මෙම කරුණ හා සම්බන්ධ ව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සමඟ සහයෝගිතාව සහිත ව වැඩමුළුවක් පැවැත්වීම සංවිධානය කරන ලදී. එය දෙසැම්බර් මස මැද දී පැවැත්වීමට නියමිත ව තිබුණ ද නො වැළැක්විය හැකි තත්ත්වයන් හේතු කොට ගෙන එළඹෙන වසරෙහි ජනවාරි මාසයට කල්තබන ලදී. ප්‍රධාන කමිටුවට සහය වීම පිණිස, කෘෂිකාර්මික ජෛව තාක්ෂණය, ශාක ආරක්ෂණය, ශාක අභිජනනය සශ්‍ය විද්‍යාව හා පශ්චාත් අස්වනු තාක්ෂණය යන විෂයයන් යටතෙහි අනුකමිටු පහක් පත්කරනු ලැබිණ.

**වැවිලි භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව (NCPCS)**

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 14 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි බහුවාර්ෂික භෝග අංශය නියෝජනය කරන, තේ පර්යේෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ, ආචාර්ය සමන් හෙට්ටිආරච්චි මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය ශානිකා ජයසේකර මහත්මිය කමිටුවෙහි ලේකම් වූවා ය. 2021 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව දැනුවත් වනු ලැබිණ. වැවිලි භෝග අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී.

**මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFLS)**

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 09 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි මල් වගා අංශය නියෝජනය කරන, ජාතික විද්‍යා පදනමෙහි සභාපති, මහාචාර්ය රංජිත් සේනාරත්න මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණී මහත්මිය කමිටුවෙහි ලේකම් වූවා ය. 2021 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව

දැනුවත් වනු ලැබිණ. මල් වගා අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී.

### වන වගා අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFS)

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 08 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි වන වගා අංශය නියෝජනය කරන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක වන සංරක්ෂක, ආචාර්ය කේ. එම්. ඒ. බණ්ඩාර මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය ශානිකා ජයසේකර මහත්මිය කමිටුවෙහි ලේකම් වූවා ය. 2021 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව දැනුවත් වනු ලැබිණ. වන වගා අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී.

### ධීවර හා ජලජ සම්පත් අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFARS)

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 11 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි ධීවර අංශය නියෝජනය කරන, ජාතික ජලජ සම්පත් නියෝජිතායතනයෙහි අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය ශානිකා ජයසේකර මහත්මිය කමිටුවෙහි ලේකම් වූවා ය. 2021 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව දැනුවත් වනු ලැබිණ. ධීවර හා ජලජ සම්පත් අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී.

### පශු සම්පත් හා කුකුළු පාලන අංශය පිළිබඳ ජාතික කමිටුව (NCLPS)

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 10 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි පශු සම්පත් අංශය නියෝජනය කරන, පශු පර්යේෂණ ආයතනයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු වෛද්‍ය ජී. ඒ. ගුණවර්ධන මහත්මිය මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි පර්යේෂණ නිලධර සමීර දිසානායක මහතා කමිටුවෙහි ලේකම් විය. 2021 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව දැනුවත් වනු ලැබිණ. පශු සම්පත් හා කුකුළු පාලන අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී.

## 2021 වර්ෂය තුළ පවත්වන ලද වැඩමුළු සහ සම්මේලන

**මල් වගා පර්යේෂණ පිළිබඳ 14 වන ජාතික සම්මේලනය 2021 (NASFLOR 14 - 2021)**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සහ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින්, මෙම ක්ෂේත්‍රයේ මෑත කාලීන පර්යේෂණ සොයාගැනීම් මතු කර දැක්වීම සහ ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා, 2021 දෙසැම්බර් මස 16 වන දින, අතථ්‍ය සම්මේලනයක් ලෙස මල් වගා පර්යේෂණ පිළිබඳ වාර්ෂික ජාතික සම්මේලනය (NASFLOR - 2021) සංවිධානය කරන ලදී. පර්යේෂකවරු, වගාකරුවෝ, අපනයනකරුවෝ සහ ප්‍රතිපත්ති සම්පාදකවරු සම්මේලනයට සහභාගී වූ අතර මෙම අංශය සංවර්ධනය කිරීම අරභයා ඔවුන් ගේ අත්දැකීම් හුවමාරු කර ගත්හ. මල් වගා අංශයට අදාළ පර්යේෂණ පත්‍රිකා 16 ක් පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරන ලද අතර එම පත්‍රිකා වර්ග හයකට කාණ්ඩගත කර ඇත.

**පෞද්ගලික - රාජ්‍ය අංශ හවුල්කාරිත්වය (PPP) පිළිබඳ වැඩමුළුව**

මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුව, 2021 දෙසැම්බර් මස 15 වන දින පෙරවරු 9.30 ට අන්තර්ජාලය හරහා පෞද්ගලික - රාජ්‍ය අංශ හවුල්කාරිත්වය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කළහ. මෙම වැඩමුළුවෙහි අරමුණ වූයේ මල් වගා අංශය සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම පිණිස පෞද්ගලික - රාජ්‍ය අංශ හවුල්කාරිත්වය උපයෝගී කර ගැනීම යි. ඕස්ට්‍රේලියාව වැනි ඇතැම් රටවල් මේ සඳහා දේශීය ආවේණික ශාක වාසිසහගත ලෙස යොදා ගනිමින් සිය පර්යේෂණ හා නිෂ්පාදන සංවර්ධනය කෙරෙහි යොමු වෙයි. මෙම නව ශාකවලට අමතර ව, සාම්ප්‍රදායික මල් වගා ශාක රාශියක් හැම වසරක ම වෙළඳපොළට හඳුන්වා දෙනු ලැබේ. මල් වගා පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ව ශක්තිමත් ජාලයක් පවතින නෙදර්ලන්තය වැනි රටවල් වෙතින් මෙවැනි ප්‍රභේද පැමිණේ. මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුවෙහි සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න මැතිතුමා පෞද්ගලික - රාජ්‍ය අංශ හවුල්කාරිත්වය පිළිබඳ වැඩමුළුවෙහි සහභාගිවන්නන් සියලු දෙනාට ම ස්තුති කරමින්, පෞද්ගලික අංශයෙහි සහයෝගිතාව සහිත නියාමක ව්‍යාපෘති එකක් හෝ දෙකක් සංවර්ධනය කරන ලෙස ඉල්ලා සිටියේ ය. පර්යේෂකවරු, වගාකරුවෝ, අපනයනකරුවෝ ඇතුළු 30 දෙනෙක් පමණ වැඩමුළුවට සහභාගී වූහ.

**පුහුණුකිරීම් සහ වෙබිනාර් (සාමූහික සමකාලික අන්තර්ජාලයික අධ්‍යයන/ සාකච්ඡා)**

ප්‍රතිපත්ති සභාව විසින්, 2021 සැප්තැම්බර් මස 23 වන දින, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි විද්‍යාඥවරුන් ගේ පර්යේෂණ සොයා ගැනීම් ප්‍රකාශයට පත්කිරීම අරභයා වෙබිනාරයක් සංවිධානය කරනු ලැබිණ. කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සභාපති මහාචාර්ය ගාමිණී සේනානායක මැතිතුමා මෙහි සම්පත් දායකයා විය. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි විද්‍යාඥවරු එකසිය පනස්



තුන් දෙනෙක් (153) අන්තර්ජාලය හරහා මෙම වෙබිනාරයට සහභාගී වූහ.

### එළවුළු සහ පලතුරු පසුඅස්වනු කළමනාකරණය පිළිබඳ උසස් තාක්ෂණවේද




ප්‍රතිපත්ති සභාව විසින්, 2021 සැප්තැම්බර් මස 28 වන දින, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි විද්‍යාඥවරුන් වෙනුවෙන්, එළවුළු සහ පලතුරු පසුඅස්වනු කළමනාකරණය පිළිබඳ උසස් තාක්ෂණවේද සම්බන්ධ ව දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරනු ලැබිණ. කාර්මික තාක්ෂණ ආයතනයෙහි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මහාචාර්ය ඉල්මි හේවාජුලිගේ මහත්මිය මෙම වැඩසටහනෙහි සම්පත් දායිකාව වූවා ය. විද්‍යාඥවරු එකසිය හැත්තෑ පස් දෙනෙක් (175) අන්තර්ජාලය හරහා මෙම වැඩසටහනට සහභාගී වූහ.

### කාබනික කෘෂිකර්මාන්තය සඳහා පෝෂක පරිපූරිත ජෛව-අඟුරු  නිෂ්පාදනය




ප්‍රතිපත්ති සභාව විසින්, 2021 නොවැම්බර් මස 09 වන දින, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි විද්‍යාඥවරුන් වෙනුවෙන්, කාබනික කෘෂිකර්මාන්තය සඳහා පෝෂක පරිපූරිත ජෛව-අඟුරු නිෂ්පාදනය සම්බන්ධ ව දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරනු ලැබිණ. ඉන්දියාවේ, භුබානේස්වර්හි ඛණිජලවණ හා පදාර්ථ තාක්ෂණ ආයතනයෙහි ප්‍රධාන විද්‍යාඥ ආචාර්ය මනිෂ් කුමාර් මහතා මෙම වැඩසටහනෙහි සම්පත් දායකයා විය. විද්‍යාඥවරු එකසිය විසි දෙදෙනෙක් (122) අන්තර්ජාලය හරහා මෙම වැඩසටහනට සහභාගී වූහ.

## කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරණය

**ආවරණය කර ඇති පැවරුම් කාර්යභාරය**

- කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවලට අවශ්‍ය වන මූල්‍ය, මිනිස්බල හා භෞතික සම්පත් පිළිබඳ ව සුදුසු බලධාරීත්වයනට නිර්දේශ ඉදිරිපත් කිරීම (4)
- ආයතනයික හා දෙපාර්තමේන්තු කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් සමාලෝචනය කිරීම සහ එම ආයතනවල ප්‍රමුඛතා හා අරමුදල් සැපයීම සම්බන්ධයෙන් සහ මුදල් හා ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා ගේ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කිරීම (5)
- කෘෂිකාර්මික පර්යේෂණ ආයතන, අංශ, සහ ව්‍යාපෘතිවල කාර්යසාධනය වරින් වර සමාලෝචනය කිරීම (13)

**කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා තොරතුරු (INFORM)**

INFORM යනු, ප්‍රතිපත්ති සභාව විසින් ක්‍රියාත්මක කෙරෙන ක්‍රමලේඛ අයවැය සකස්කිරීම ඇතුළත් තොරතුරු කළමනාකරණ පද්ධතියකි. INFORM දත්ත පදනම කළමනාකරණය කිරීම ද සිදු කරනුයේ ප්‍රතිපත්ති සභාව යි. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතන 13 ක් එනම්, පොල් පර්යේෂණ ආයතනය (CRI), තල් පර්යේෂණ ආයතනය (PRI), රබර් පර්යේෂණ ආයතනය (RRI), උක් පර්යේෂණ ආයතනය (SRI), තේ පර්යේෂණ ආයතනය (TRI), පශු පර්යේෂණ ආයතනය (VRI), ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායනය (NARA), පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය (IPHT), හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI) , ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව (DNBG), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DFC), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DEA) සහ උප ආයතන 19 ක් ඇතුළු ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA) වෙතින් ප්‍රතිපත්ති සභාව වාර්ෂික ව, විද්‍යුත් ආකෘතියක් තුළ, පර්යේෂණ නිලධරයන්, පර්යේෂණ ව්‍යාපෘති සහ පුනරාවර්තන පර්යේෂණ අයවැය පිළිබඳ ගෙවුණු වර්ෂයට සම්බන්ධ තොරතුරු එක්රැස් කරයි.

2021 වර්ෂය තුළ දී, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතන 12 ක් වෙතින් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උප ආයතන 19 ක් වෙතින් 2020 වසර පිළිබඳ තාත්වික දත්ත සම්බන්ධ තොරතුරු ඉල්ලා සිටින ලදී. 2021 වසරෙහි දී දත්ත පදනම් තිස් එකක් එකතු කිරීමට අපේක්ෂා කළ අතර තිහක් එකතු කරන ලදී. එක්රැස් කරන ලද දත්ත පදනම් සකස් කර, පිරිපහදු කර යළි අදාළ ආයතනයවලට ඉදිරිපත් කෙරිණ. සකස් කරන ලද මෙම දත්ත පදනම් ඉන්ෆෝර්ම් - 2020 ජාතික දත්ත පදනම ලෙස සම්පාදනය කෙරිණ. ඉන්ෆෝර්ම් සම්බන්ධිකාරකවරුන් පස් දනකු හට විශාලනය යටතෙහි පෞද්ගලික පුහුණුව ලබා දෙන ලදී. INFORM – 2018 ප්‍රකාශනයට පත්කෙරිණ.

**පර්යේෂණ ආයතන පිළිබඳ බාහිර සමාලෝචනය - 2021**

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි පර්යේෂණ ආයතනවල පර්යේෂණ කාර්ය සාධනය නිර්ණය කිරීම් වස් එම ආයතන බාහිර සමාලෝචනයට භාජනය කිරීම ද කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවට අයත් වැදගත් පැවරුම් කාර්යභාරයකි. මෙම බාහිර අගැයීම්වල ප්‍රධාන අරමුණු වනුයේ කාර්ය සාධනය අගැයීම, ප්‍රශස්ත ක්‍රියා පටිපාටි හඳුනා ගැනීම, අඛණ්ඩ සංවර්ධනය දිරිගැන්වීම හා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය ඇතුළත පර්යේෂණ සංස්කෘතියක් සංස්ථාපනය කිරීම යි. බාහිර

සමාලෝචනයෙහි ප්‍රධාන අංග වනුයේ: ආයතනමය ස්වයං-අගැයීම, සමාලෝචන නිල පිරික්සුම් හා පරික්ෂාවට භාජනය කරන ලද සාක්ෂි ඒකරාශි කරමින්, විනිශ්චය සහ විවරණය සහිත ව සකස් කෙරෙන සමාලෝචන වාරතාව යි. බාහිර සමාලෝචනයන්හි සමස්ත අරමුණ වනුයේ පර්යේෂණ ඉලක්ක සපුරා ගැනීම උදෙසා යහපත් ක්‍රියාමාර්ග හුවමාරුව ප්‍රවර්ධනය සහ අඛණ්ඩ සංවර්ධනය දිරිගැන්වීම වෙනුවෙන් සමපදස්ථ සමාලෝචන ක්‍රියා පටිපාටිය භාවිත කිරීම යි. මෙම සමස්ත අරමුණ, 1. ස්වයං-විශ්වාසය 2. වගකීම් සහිතබව 3. තොරතුරු 4. වැඩිදියුණු කිරීම වැනි විශේෂිත අංගවලට විභාජනය කළ හැකි වේ.

සභා පාලක මණ්ඩලය විසින් පත්කරන ලද විද්වත් කමිටුවක් විසින්, 2021 හිදී, ආයතන පිළිබඳ බාහිර සමාලෝචනය සිදු කිරීම සඳහා වන ආකෘතිමය මාර්ගෝපදේශ සංවර්ධනය කරනු ලැබිණ. රුහුණ විශ්ව විද්‍යාලයයේ, ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණවේදය පීඨයේ මහාචාර්ය තිලක් පී. ඩී. ගමගේ (කමිටුවේ සභාපති), සනස විශ්ව විද්‍යාලයයේ, කළමනාකරණ හා මූල්‍ය  පීඨයේ පීඨාධිපති, ආචාර්ය ඩී. එස්. පී. කුරුප්පුආරච්චි, සී. අයි. සී. ඇග්‍රිබිස්නස්හි ජ්‍යෙෂ්ඨ උපදේශක (පර්යේෂණ සහ සංවර්ධන),  ආචාර්ය ඩී. එස්. ද ඉසෙඩ්. අබේසිරිවර්ධන මෙම කමිටුවෙහි සාමාජිකවරු වූහ.

2021 වසරෙහි දී,  කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය සහ සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය බාහිර සමාලෝචනයට භාජනය කිරීස පිණිස සභා  පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. මෙම ආයතන දෙකෙහි බාහිර සමාලෝචනය සිදු කිරීම සඳහා සභා පාලක මණ්ඩලය විසින් කමිටු දෙකක් පත්කර ඇති අතර එක් එක් කමිටුවෙහි සාමාජිකවරු තිදෙනෙක් වෙති. ආයතන දෙක වෙතින් ස්වයං-අගැයීම් වාර්තා ලබා ගෙන තිබේ. කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතු කොට ගෙන පනවන ලද චාරිකා සීමාකිරීම් නිසා ආයතන වෙත සමාලෝචන නිල පිරික්සුම් සිදු කිරීමට නො හැකි විය.

**ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ වර්ෂ-අවසාන ප්‍රගති සමාලෝචනය - 2020**

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ සියලු ම පර්යේෂණ ආයතනවල ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම ප්‍රතිපත්ති සභාවෙහි  කාර්ය පැවරුම් අවශ්‍යතාවක් වේ. සභා පාලක මණ්ඩලය විසින් පත්කරන ලද විද්වත් මඬුල්ලක් විසින් මෙම සමාලෝචනය සිදු කරනු ලැබේ. පර්යේෂණ ආයතනයෙහි ප්‍රධානයා හෝ නියෝජිතයකු විසින් ආයතනය සම්බන්ධ තොරතුරු සහ ආයතනයෙහි ප්‍රගතිය පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් සිදු කෙරේ. ප්‍රගති සමාලෝචන වාර්තාව අනුමැතිය සඳහා සභා පාලක මණ්ඩලය වෙත යොමු කිරීමෙන් අනතුරු ව අදාළ ආයතන වෙත යවනු ලැබේ.

අමාත්‍යාශ 5 ක් යටතෙහි පවතින පර්යේෂණ ආයතන/ මධ්‍යස්ථාන 25 ක පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම්වල 2020 වසරෙහි දෙසැම්බර් මස අවසානයෙහි දී පැවති කාර්යසාධනය පරීක්ෂාවට ලක්කෙරිණ. පර්යේෂණවල අදාළත්වය, පර්යේෂණ සොයාගැනීම්වල පලදායිතාව, කාර්යක්ෂමතාව, පර්යේෂණ ප්‍රතිදාන, පර්යේෂණ ප්‍රතිසාධනය, ව්‍යාප්ත කිරීම/ බෙදා හැරීම හා හවුල්කාරිත්වයන් පිළිබඳ ආයතනයික තොරතුරු මත පදනම් වුණු ඉදිරිපත් කිරීම් 2021 ජනවාරි මස 27 වන දින සිදු කරන ලදී. කෘෂිකාර්මික ක්ෂෙත්‍රයට සම්බන්ධ විද්වත්  සමාලෝචකවරුන් ගේ සහභාගිත්වය සහිත ව මෙම ප්‍රගති සමාලෝචනය සිදු කෙරිණ. සාරාංශ ලේඛනයක් පිළියෙළ කර අවසන් කරන ලදු ව, රජයේ ඉහළ මට්ටමෙහි බලධරයන් හට ඉදිරිපත් කරනු ලැබිණ. මෙම කාර්යයට සහභාගි වූ විද්‍යාඥවරු සංඛ්‍යාව ආසන්න වශයෙන් 60 ක් වූහ.

## විද්‍යාඥවරුන් අභිප්‍රේරණය කිරීම

**ආවරණය කර ඇති පැවරුම් කාර්යභාරය**

- කෘෂිකාර්මික පර්යේෂණ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම (6)
- සමස්ත කෘෂිකාර්මික පර්යේෂණ අංශය සඳහා විශේෂ විද්‍යාත්මක සේවාවන් සංවිධානය කිරීම හා අරමුදල් සැපයීම (9)

**ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සඟරාව (SLJFA)**

2021 වර්ෂය තුළ දී පර්යේෂණ පත්‍රිකා 11 කට වැඩි ප්‍රමාණයක් සමාලෝචනය කරනු ලැබිණ. ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සඟරාවේ 7 වන වෙළුම, 1 වන කලාපය සහ 7 වන වෙළුම, 2 වන කලාපය ශ්‍රී ලංකා අන්තර්ජාලයීය සඟරා දත්ත පදනමෙහි (SLJOL) ප්‍රකාශයට පත් කරන ලදී. අරමුදල් ඌනතාව, මුද්‍රණය කරන ලද සඟරා පිටපත් (ISSN 2424-6913) බෙදා හැරීම කෙරෙහි බලපෑම් ඇති කළේ ය. ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සඟරාව අනුගමනය කරන ප්‍රතිපත්තිය වනුයේ සංස්කාරක මණ්ඩලය විසින්, හැම වසරක ම ජුනි 30 දින හෝ එම දිනට පෙර සහ දෙසැම්බර් 31 දින හෝ එම දිනට පෙර සමාලෝචනය කරන ලදු ව, සංශෝධනය කරනු ලැබ, ප්‍රකාශයට පත් කිරීම සඳහා පිළිගත් පර්යේෂණ පත්‍රිකා පිළිවෙලින් 1 වන සහ 2 වන කලාපවල ප්‍රකාශයට පත් කිරීම යි.

**පර්යේෂණ දීමනා වැඩසටහන**

ශ්‍රී ලංකා රජය, වටිනාකම් සහිත පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සඳහා පර්යේෂකයන් හට දිරිදීමනාවක් ලබා දී ඇත. එමෙන් ම, මෙම වැඩසටහන, ඔවුන් ගේ විශේෂඥ ක්ෂේත්‍රයන්ට අදාළ වන වර්තමාන ඉල්ලීම් සපුරාලීම පිණිස ඉහළ නවෝත්පාදනය සහිත පර්යේෂණ සිදු කිරීමට ඔවුන් දිරිමත් කිරීමේ යාන්ත්‍රණයක් ලෙස ද සැලකේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 2/2014 හරහා මෙය ක්‍රියාත්මක වේ. චක්‍රලේඛයට අනුකූල ව, කෘෂිකාර්මික අංශයේ පර්යේෂකයන් සඳහා පර්යේෂණ දීමනාව අනුමත කිරීමේ බලය ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවට පැවරී ඇත. පර්යේෂණ දීමනාව සඳහා ඉදිරිපත් වූ අයදුම්පත් 96 ක් අගැයීමට භාජනය කරන ලදී.

## අරමුදල් සැපයීම

**ආවරණය කර ඇති පැවරුම් කාර්යභාරය**

- අන්තර්-ආයතනයික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම සහ අරමුදල් සඳහා කටයුතු සම්පාදනය කිරීම (8)

**අන්තර්-ආයතනයික සහ බහුවිෂයාත්මක පර්යේෂණ ප්‍රදාන යෝජනාක්‍රමය**

මෙම අන්තර්-ආයතනයික සහ බහුවිෂයාත්මක පර්යේෂණ ප්‍රදාන යෝජනාක්‍රමය, තරඟකාරී පදනමක් මත, ප්‍රතිපත්ති සභාව හඳුනා ගෙන ඇති පර්යේෂණ ප්‍රමුඛතා යටතෙහි කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ ආයතනවලට සහ ජාතික විශ්ව විද්‍යාල පද්ධතියට අරමුදල් සපයයි. පර්යේෂණ වැඩසටහන් අන්තර්-ආයතනයික සහ බහුවිෂයාත්මක විය යුතු වේ. 2021 හි දී, තෝරා ගන්නා ලද සංකල්ප පත්‍රිකා 04 ක් මත පදනම් වූ පර්යේෂණ යෝජනාවලි 04 ක් ඉදිරිපත් විය. ප්‍රතිපත්ති සභාව අනුගමනය කරන ප්‍රමිති ක්‍රියාවලියක් මඟින් අගැයීමට බඳුන් කරන ලදුව, සහා පාලක මණ්ඩලයෙහි අනුමැතිය ලැබ, මෙම ව්‍යාපෘති සතර ම ප්‍රදානය කරනු ලැබිණ. මෙම ව්‍යාපෘති පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු 1 වන වගුවෙහි දැක්වේ. 2 වන වගුවෙහි දැක්වෙනුයේ 2021 හි දී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති යි.

**වගුව 1: ප්‍රදානය කරන ලද පර්යේෂණ ව්‍යාපෘති**

| ආයතනය | පර්යේෂණ ව්‍යාපෘතියේ නම | ප්‍රධාන ගවේෂක | ප්‍රදානය කළ වර්ෂය |
|---|---|---|---|
